# පුස්කොළ පොත්වල දැකිය හැකි සෞන්දර්යාත්මක අංග හා කලාත්මක අංග පිළිබඳව අධ්‍යයනයක්

**කුසුම්ලතා පී.බී.අයි.කේ.**[1]

පුස්කොළ පොත්වල අනෙකුත් අංශයන් මෙන්ම ඒ හා බද්ධ උත්කෘෂ්ඨ සෞන්දර්යාත්මක හා කලාත්මක අංග රාශියක් හඳුනාගත හැකි වේ. අපගේ පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ පුස්කොළ පොත් කලාවේ දී යොදා ගනු ලබන සෞන්දර්යාත්මක හා කලාත්මක අංග  එක් කිරීමට හේතුව කුමක්ද යන්නයි. මෙම අංග පිළිබඳව පුලුල් අවබෝධයක් ලැබීම හා ඒ පිළිබඳ හඳුනා ගැනීම යන අරමුණු මුල් කර ගෙන මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සාහිත්‍ය මූලාශ්‍රත් ද්විතීක මූලාශ්‍ර ලෙස අන්තර්ජාලයත් යොදා ගැණිනි. පුස්කොළ පොත්වල සෞන්දර්යාත්මක හා කලාත්මක අංග විමසීමේ දී විශේෂයෙන් කැටයම්  වැදගත් වන අතර එහි දී දැව කැටයම්, ඇත් දත් කැටයම් ලෝහ කැටයම් හා වාත්තු වැඩ විශේෂ තැනක් ගනී. පොත් කම්බා තුලින් මේවා ඉතා උසස් ලෙස හඳුනාගත හැකි වේ. මෙකී විවිධ කැටයම් මගින් කලාත්මක, ඓතිහාසික හා සිත්ගන්නාසුලු ස්වභාවය ඔප්නංවාලීම සිදුව ඇත. එසේම සෞන්දර්‍යාත්මක හා කලාත්මක අංග අතර ලාක්ෂා සැරසිලි වැඩ ද ඇති අතර එමගින් පුස්කොළ පොත් අලංකරණයේදී,පාඨක රුචිකත්වය ඇද ගැනීමට පමණක් නොව සාම්ප්‍රධායික ක්‍රම තවදුරටත් ආරක්ෂා කර ගැනීම,පොතේ කල් පැවැත්ම ආදියට ද හේතු ව වී ඇත. පුස්කොළ සිතුවම් කලාව ද සුවිශේෂී අතර ස්වභාවික වර්ණයක් හෝ ලාක්ෂා භාවිතයෙක් සිතුවම් කර තිබේ. පුස්කොළ පොත්වල මෙකී සියලුම අලංකාර අංග සඳහා ආවේණික දේශීය සාම්ප්‍රධායික හා පාරම්පරික මෝස්තර රටා යොදා ගෙන තිබේ. ඒවා බුද්ධි ගෝචර වනවාට වඩා අක්ෂි ගෝචර සැරසිලි කලාවක් ලෙස සැලකීම උචිතය. පුස්කොළ පොත් කෙරෙහි මෙකී සෞන්දර්යාත්මක හා කලාත්මක අංග සම්බන්ධ කිරීමේ අපේක්ෂිතාර්ථය හුදෙක් ඒවායේ අලංකාරය ,විචිත්‍රත්වය ඇති කිරීම පමණක්ම නොව  පාඨකයින්ගේ කියවීමේ  රුචිය වර්ධනය , විෂයානු බද්ධ කරුණු පිළිබදව අවබෝධයක් ලබා දීම, පොත් කෙරෙහි භක්ති පූර්වක ගෞරවයක් ඇති කිරීම,පරිහරණය කෙරෙහි ප්‍රසන්න හැගීම් උද්දීපනය වැනි විවිධ අරමුණු මූල් කරගෙන තිබේ. උක්ත කරුණු අනුව නිගමනය කළ හැක්කේ පුස්කොළ පොත්වල වූ මෙකී සෞන්දර්යාත්මක හා කලාත්මක අංගයන් තුලින් එහි අලංකාරත්වයත් පාඨක රුචිකත්වයත්,ඓතිහාසිකත්වයත් රැක ගෙන ඇති බවයි.

**මුඛ්‍ය පද :** පුස්කොළ පොත්, සෞන්දර්‍යාත්මක හා කලාත්මක අංග, කැටයම්, සිතුවම්

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
indrakumari9760@gmail.com